# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2417/55 - 2025 ජනවාරි මස 04 වැනි සෙනසුරාදා - 2025.01.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වගන්තිය යටතේ වූ පවරා ගැනීමේ නියමය අවලංගු කිරීම

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 15 (1) වගන්තිය යටතේ එවකට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙත පැවරී තිබූ බලතල ප්‍රකාර 2021.04.24 දිනැති අංක 2224/52 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 15 (1) වගන්තිය යටතේ නියමයෙන් මෙහි පහත උපලේඛනයේ වඩාත් සවිස්තර ලෙස දක්වා ඇති ඉඩම් හා ගොඩනැගිලි පරිශ්‍රය නාගරික සංවර්ධන අධිකාරිය සතු කරනු ලැබීය.

එනමුත්, කොළඹ මහනගර සභාව හා ඒකාබද්ධව සිදුකිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එකී දේපළ තවදුරටත් නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවත්වාගෙන යාමට අවශ්‍ය නොවන බවට නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මම විසින් තීරණය කරන හෙයින් අංක 2224/52 සහ 2021.04.24 වැනි දින රජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත 15 (1) වන වගන්තිය යටතේ වූ නියමය මෙයින් අවලංගු කරමි.

**අනුර කරුණාතිලක (පා.ම.).**
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය.

2024 දෙසැම්බර් මස 30 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
සෙත්සිරිපාය, අදියර II,
බත්තරමුල්ල.
2024.12.30

1A - G43419 - 06 (2025/01)

*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක*

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොල්ලුපිටිය ගමේ (කොට්ඨාස අංක 37 - කොල්ලුපිටිය ) පිහිටි සර්වේ ජනරාල් විසින් 2014.12.31 දින මැන පිළියෙළ කරන ලද මු.පි.කො 9512 දරන පිඹුරෙහි කැබලි අංක 1 න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්. 0.2773 ක් පමණ වන ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවතේ වරිපනම් අංක 19 දරන ස්ථානයේ පිහිටියා වූ ද පහත සඳහන් මායිම්වලින් යුක්ත කොල්ලුපිටිය සුපිරි වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම.

කැබලි අංක 1 ට මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 225 දරන ඉඩම, ශාන්ත මයිකල් පාරේ වරිපනම් අංක 18, 20 හා 28 දරන ඉඩම් සහ සෙරන්ඩිබ් පාර; |
| නැගෙනහිරට | : | සෙරන්ඩිබ් පාර සහ ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත; |
| දකුණට | : | ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත සහ ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවතේ වරිපනම් අංක 13 දරන ඉඩම; |
| බටහිරට | : | ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවතේ වරිපනම් අංක 13 දරන ඉඩම සහ කොල්ලුපිටිය පාරේ වරිපනම් අංක 225 දරන ඉඩම. |



EOG 01 - 0042

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.